සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்

**Sabaragamuwa Provincial Education Department**

| | | | |
|---|---|---|---|
| තෙවන වාර පරීක්ෂණය | - 2024 | ශ්‍රේණිය | - 13 |
| மூன்றாம் கால சோதனை | - 2024 | தரம் | - 13 |
| Third term test | - 2024 | Grade | - 13 |

| | | | |
|---|---|---|---|
| නර්තනය | I | කාලය | - පැය 2.00 |
| நடனம் | I | நேரம் | - 2.00 மணி |
| Dancing | I | Time | - 2.00 hours |

**උපදෙස්**

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සැපයිය යුතු ය.
- එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 **කි.**
- අංක 1 සිට 25 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ වඩාත් ම ගැලපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය ප්‍රශ්නය ඉදිරියෙහි ඇති වරහන තුළ ලියන්න.

**I - කොටස**

01) නර්තන ශිල්පියෙකු උඩරට, පහතරට සහ සබරගමු නර්තන සම්ප්‍රදායන් හැදෑරීමේ දී කරනු ලබන සරඹයන් පිළිවෙලින්,

I. මණ්ඩි පද, පා සරඹ, දොඹින පද
II. පා සරඹ, පා සරඹ, මණ්ඩි පද
III. ගොඩ සරඹ, ඉලංගම් සරඹ, දොඹින පද
IV. ගොඩ සරඹ, පා සරඹ, මණ්ඩි පද
V. මණ්ඩි පද, පා සරඹ, ඉලංගම් සරඹ ( ........... )

02) සිංහල නර්තන කලාව හා සබරගමු කිරිමඩු ශාන්තිකර්මය යන කෘති රචනා කරන ලද්දේ පිළිවෙලින්,

I. මුදියන්සේ දිසානායක මහතා, ජයසේන කෝට්ටගොඩ මහතා
II. ජයසේන කෝට්ටගොඩ මහතා, මුදියන්සේ දිසානායක මහතා
III. මුදියන්සේ දිසානායක මහතා, ශ්‍රියාණි රාජපක්ෂ මහත්මිය
IV. ජයසේන කෝට්ටගොඩ මහතා, ශ්‍රියාණි රාජපක්ෂ මහත්මිය
V. මුදියන්සේ දිසානායක මහතා, බුද්ධි කල්‍යාණි මහත්මිය ( ........... )

03) දොංත ගතම් දොංත ගදි ගතම් ......යන පදයට කෝලම් නාට්‍යයේ දී සභාවට පිවිසෙන්නේ,

I ජසයා II නොංචි III අණබෙරකරු IV මුදලි V නොංචි ( ........... )

04) සූර්ය පිරෙයි චන්ද පිරෙයි පදක්කම් යන ආභරණ පළඳිනු ලබන්නේ,

I. කථක් නර්තන සම්ප්‍රදාය
II. කථකලී නර්තන සම්ප්‍රදාය
III. භරත නර්තන සම්ප්‍රදාය
IV. මණිපූරි නර්තන සම්ප්‍රදාය ( ........... )
V. කුච්චිපුඩි නර්තන සම්ප්‍රදාය

05) ගම්පොළ යුගයේ නර්තන කලාව හා සබැඳි කැටයම් දැකිය හැක්කේ,

I. ඇම්බැක්කේ දේවාලයෙන්
II. ගඩලාදෙණිය විහාරයෙන්
III. ගලපාත විහාරයෙන් ( ........... )
IV. සැටදාගෙයින්
V. ලෝවාමහා ප්‍රාසාදයෙන්

06) අනුපිළිවෙලින් ශෝක, විශ්ම, හාස්‍යය භාවයන්ගෙන් නිෂ්පන්න වන රසයන් වන්නේ,

I. භයානක, කරුණා, වීර
II. බීභක්ස්‍ය, හාස්‍ය, රෞද්‍ර
III. කරුණා, අද්භූත, හාස්‍ය ( ........... )
IV. ශෘංගාර, වීර, කරුණා
V. අත්භූත, විර, භයානක

07) කිරිමඩු ශාන්තිකර්මයේ ඇත් බන්ධන, මී බන්ධන අවස්ථාවල දී ඇතා සහ මීමා නිරූපණය කරන්නේ,

I. කොට්ටෝරුවා ය
II. වන්නකුරාළ ය
III. නෙල්ලිකොත්තුවා ය
IV. යකැදුරන් ය ( ........... )
V. බෙරවාදන ශිල්පියා ය

08) තහලම් කළ බෙර තම්මැට පටතන්තිරි ඩමරු ..... යන කවි පදය ද දැක්වෙන්නේ,

I. ගම්පළ යුගයට අයත් මයුර සංදේශයේ ය.
II. දඹදෙණි යුගයට අයත් කෝකිල සංදේශයේ ය.
III. ගම්පළ යුගයට අයත් තිසර සංදේශයේ ය.
IV. කෝට්ටේ යුගයට අයත් පරෙවි සංදේශයේ ය. ( ........... )
V. කෝට්ටේ යුගයට අයත් සරළලිහිණි සංදේශයේ ය.

09) සියොපත් පතිනේ දිගුණුව නෙතිනේ.......මෙම කවිය,

I. කුවේණි අස්නේ දී ගායනය කරයි.

II. කොහොඹ හැල්ලේ දී ගායනය කරයි.

III. බලි ශාන්තිනර්මයේ දී ගායනය කරයි.

IV. මඩු පුරයේ දී ගායනය කරයි.

V. පන්තේරු නැටුමේ දී ගායනය කරයි. ( ........... )

10) මුල් මාත්‍රය සහ ශුද්ධ මාත්‍රය යන නර්තනාංග අයත් වන්නේ,

I. උඩරට සහ පහතරට සම්ප්‍රදායන්ට ය.

II. උඩරට සහ සබරගමු සම්ප්‍රදායන්ට ය.

III. පහතරට සහ සබරගමු සම්ප්‍රදායන්ට ය.

IV. පහතරට සහ උඩරට සම්ප්‍රදායන්ට ය.

V. සබරගමු සහ පහතරට සම්ප්‍රදායන්ට ය. ( ........... )

11) අවගාරය, පුල්ලෝරම, පත්උල යනුවෙන් හඳුන්වන්නේ,

I. නර්තනාංගවල දී භාවිත කරන රංග උපකරණයන් ය.

II. කිරිමඩු ශාන්තිකර්මයේ දී භාවිත කරන පාරිභාෂික වචන ය.

III. බෙර සැකසීම සඳහා ගන්නා උපකරණ ය.

IV. බලි ශාන්තිකර්මයේ දී භාවිත කරන සැරසිලි ය.

V. කොහොඹ කංකාරියේ යක්කම්වල දී භාවිත කරන පාරිභාෂික වචනය. ( ........... )

12) පිළිවෙලින් උඩරට, පහතරට සහ සබරගමු ශාන්තිකර්මවලට අයත් නාට්‍යමය අවස්ථා වනුයේ,

I. ඌරා යක්කම, නයා යක්කම, වැදි යක්කම

II. ඌරා යක්කම, නානුමුරය, පොත්කඩේ යක්කම

III. හාතා යක්කම, නානුමුරය, පොත්කඩේ යක්කම

IV. මුවමල විදීම, ගුරුගේ මාලාව, පොත්කඩේ යක්කම

V. අඹ විදමන, නානුමුරය, ඇත් බන්ධනය ( ........... )

13) මහනුවර යුගයේ දී රජ වාසල සම්බන්ධව ආයතන 5ක් තිබූ බව සඳහන් කර ඇත්තේ,

I. එදා හෙළදිව කෘතියේ ය.

II. විදේශීන් දුටු පුරාණ ලංකාව කෘතියේ ය.

III. ජෝන් ඩේවිගේ කෘතියේ ය.

IV. ඉබන් බතුතාගේ වාර්තාවෙහි ය.

V. සිහබා අස්න කෘතියෙහි ය. ( ........... )

14) සොලොස්මගල නම් වූ සැරසිල්ලට විශේෂ සැලකිල්ලක් හිමි වන්නේ,

I. පහන් මඩු ශාන්තිකර්මයේ දී

II. පූනා මඩු ශාන්තිකර්මයේ දී

III. දානේ මඩු ශාන්තිකර්මයේ දී

IV. කිර්මඩු ශාන්තිකර්මයේ දී

V. වලියක් මංගල්ලයේ දී ( ........... )

15) එක් එක් බලියේ ස්වභාවය පිළිබඳ ව වර්ණනා කෙරෙන කවි මෙනමින් හැඳින්වේ.

I. බලි මඩුපුරය කවි

II. සිරස පාද කවි

III. හිංහතරේ කවි

IV. ඇඹුම් කවි

V. ග්‍රහපන්ති කවි ( ........... )

16) නර්තන කලාව පිළිබඳ තොරතුරු විමසීමේ දී කඳවුරු සිරිත සහ උම්මග්ග ජාතකය අයත් වන්නේ,

I. පොළොන්නරු සහ කුරුණෑගල යුගයන්ට ය.

II. පොළොන්නරු සහ දඹදෙණි යුගයන්ට ය.

III. දඹදෙණි සහ කුරුණෑගල යුගයන්ට ය.

IV. අනුරාධපුර සහ පොළොන්නරු යුගයන්ට ය.

V. යාපහුව සහ කුරුණෑගල යුගයන්ට ය. ( ........... )

17) කෝලම් නාටකයේ ජස කෝලම සහ සම්බන්ධ අනෙකුත් චරිත වනුයේ,

I. මුදලි, ලෙන්චිනා, හෙංචප්පු

II. ආරච්චි, පොලිස්, පුරංසිනා

III. පොලිස්, හෙංචප්පු, මුදලි

IV. නොංචි, පුරංසිනා, ආරච්චි

V. ආරච්චි, මුදලි, පොලිස් ( ........... )

18) ශිල්පීය දක්ෂතා දක්වමින් දෙදෙනෙකු අතර කරනු ලබන බෙර වාදනය,

I. මගුල් බෙර වාදනය

II. පිං බෙර වාදනය

III. හේවිසි වාදනය

IV. අත්‍යා බෙර වාදනය

V. තම්මැට්ටම් වාදනය ( ........... )

19) සිවිලිය නම් විශේෂ හිස් පළඳනාව පැළඳ නටනු ලබන ශාන්තිකර්මය වනුයේ,

I. කිරිමඩු ශාන්තිකර්මය
II. කඩවර කංකාරිය
III. වලියක් මංගල්ලය
IV. කිරි ඉතිරුම් මංගල්ලය
V. කොහොඹ කංකාරි ශාන්තිකර්මය ( .......... )

20) යන්ත්‍ර මන්ත්‍ර සන්න යාදිනි ආදී ගායනා අයත් වන්නේ ,

I. ආසාතාත්මක ගායනාවලට ය.
II. ආනාසාතාත්මක ගායනාවලට ය.
III. ගායනා මූලික කර ගත් නර්තන අංග සදහා ය.
IV. නාට්‍යමය අංග ලක්ෂණ සහිත පෙළපාලි සදහා ය.
V. බෙර පද මූලික කොට ගත් නර්තන අංග සදහා ය. ( .......... )

21) කථා වාචක හෙවත් කථා කහේ යන නමින් පොදු ජනයා අතර පැවති කථා කීමේ කලාව අයත් වන්නේ,

I. දක්ෂිණ භාරතයේ කථකලි නර්තන සම්ප්‍රදායට ය.
II. දක්ෂිණ භාරතයේ භරත නර්තන සම්ප්‍රදායට ය.
III. උත්තර භාරතයේ කථක් නර්තන සම්ප්‍රදායට ය.
IV. උත්තර භාරතයේ  මණිපුරි නර්තන සම්ප්‍රදායට ය.
V. දක්ෂිණ භාරතයේ කථක් නර්තන සම්ප්‍රදායට ය. ( .......... )

22) ගුංගුරු හා චුඩිදාර් යන රංග වස්ත්‍රාභරණ භාවිත කරනු ලබන්නේ,

I. කථකලී නර්තන සම්ප්‍රදායේ ය.
II. කථක් නර්තන සම්ප්‍රදායේ ය.
III. භරත නර්තන සම්ප්‍රදායේ ය.
IV. ඔඩිසි නර්තන සම්ප්‍රදායේ ය.
V. මණිපූරි නර්තන සම්ප්‍රදායේ ය. ( .......... )

23) කොහොඹ කංකාරි ශාන්තිකර්මයේ දී භාවිත කරනු ලබන සැරසිලි අංග වනුයේ,

I. පත්තිනි, තොරණ, සූනියම්
II. අයිලය, යහන, මුවය සහිත කෙසෙල් ගස
III. පත්තිනි තොරණ, දෙවොල් තොරණ, පත්තිරිප්පුව
IV. කුමාර වීදිය, පූනා වීදිය, සූනියම් වීදිය
V. මහසොහොන් වීදිය, සූනියම් වීදිය, පූනා වීදිය ( .......... )

24) කර්ණාට තාල පද්ධතියේ මිශ්‍ර දීප් චන්ද්‍ර තාලය සමාන වනුයේ දේශීය තාල පද්ධතියේ,

I. මාත්‍රා 2 + 3 තාල රූපයට

II. මාත්‍රා 3 + 4 තාල රූපයට

III. මාත්‍රා 2 + 2 + 3 තාල රූපයට

IV. මාත්‍රා 3 + 3 තාල රූපයට

V. මාත්‍රා 2 + 3 + 3 තාල රූපයට ( ........... )

25) චලනයේ දී ස්වභාවය වෙනස් වීම කෙරෙහි බලපාන සාධක වන්නේ,

I. චලනය, අවකාශ, රටා, සම්බන්ධතා

II. ශක්තිය, වේගය, දුර, කාලය

III. අවකාශ, රටා, හැඩතල

IV. අංග, ප්‍රත්‍යාංග, උපාංග, ශක්තිය

V. දිසා, තල, සම්බන්ධතා, කාලය ( ........... )

- **අංක 26 සිට 35 තෙක් දී ප්‍රශ්නවල ඇති එක් එක් වාක්‍යයේ හිස්තැනට සුදුසු වචන /වචනය යොදන්න.**

26) වලියක් මංගල්‍ය ශාන්තිකර්මයේ දී වන්නකුරාළ යක්දෙස්සාගේ නළල මත ------------- ගැම විශේෂ චාරිත්‍රයකි.

27) කිරිමඩුව ශාන්තිකර්මයේ ප්‍රධාන පරාමාර්ථය කිරි උතුරවා සෙත් ශාන්ති කොට සෞභාග්‍ය ළඟා කර ගැනීම ය. මේ සඳහා තැනෙන සැරසිල්ල ----------- යනුවෙන් හඳුන්වයි.

28) බැලේ රංග කලාව සඳහා බැලරිනාවන් විසින් අඳිනු ලබන රැළි සහිත කොට ගවුම -------------- නමින් හඳුන්වයි.

29) රටයකුමේ පැදුරක් මත හිඳ දීර්ඝ වේලාවක් සංවාද ඉදිරිපත් කිරීමේ සුවිශේෂ නාට්‍යමය අවස්ථාවකි --------------------

30) අසුර යක්කම හා පොත්කඩේ යක්කම අයත් වන්නේ --------------- සම්ප්‍රදායට ය.

31) භරතමුණි සිය නාට්‍ය ශාස්ත්‍රයේ දක්වන ආකාරයට ස්ථායී භාවයන් ගණනින් ------------ කි.

32) තම්මැට්ටම වාදනයේ දී ගැඹුරු හඬක් උද්දීපනය වන්නේ -------------------- කොටසිනි.

33) කහ රොටී දානය හා මී කැඩීම යන නර්තන අංග අයත් වන්නේ ---------------- ශාන්තිකර්මයට ය.

34) භරත නාට්‍ය සංදර්ශනයක මාර්ගම් අනුපිළිවලට අනුව ඉතා දීර්ඝ වූත් අසිරු වූ ත් නර්තනාංගය ---------------- නම් වේ.

35) ලෝක ධර්ම නාට්‍ය හඳුන්වන තවත් නමකි ------------------

• **අංක 36 සිට 50 තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුරු තිත් ඉරි මත ලියන්න.**

**36)** "ඇත එපිට දීපංකර මුණි විවරණ ගන්නේ " මෙහි ඇතුලත් ලඝු ගුරු අක්ෂර ගණන වන්නේ

I ලඝු ---------------

II ගුරු ---------------

**37)** පටාචාරා සහ බැරිසිල් මුද්‍රා නාට්‍ය නිර්මාණය කරන ලද්දේ කවුරුන් විසින් ද?

I පටාචාරා ---------------

II බැරිසිල් ---------------

**38)** **" අක්ක ඉතින් නාඩන්නේ එක්ව ගෙසින් අප එන්නේ "** මෙම ගායනය ඇතුලත් ශාන්තිකර්මය හා නර්තන අංගය නම් කරන්න.

I ශාන්තිකර්මය ---------------

II නර්තන අංගය ---------------

**39)** මාත්‍රා 2 +2 +2+4+4 තාල රූපයට අයත් උඩරට සහ සබරගමු නර්තනාංග දෙක නම් කරන්න.

I උඩරට ---------------

II සබරගමු ---------------

**40)** ලොව ප්‍රථම බැලේ පුහුණු පාසල සහ එහි නිර්මාතෘවරයා වන්නේ,

I පුහුණු පාසල ---------------

II නිර්මාතෘවරයා ---------------

**41)** **" විදෙන ලෙලෙන නරු බර පුළුලුකුල රැඳී - හෙලන නගන අත නුවනග බැලුම් දිදී "** යන කාව්‍ය අයත් ග්‍රන්ථය හා එය අයත් යුගය ලියන්න.

I කාව්‍ය ග්‍රන්ථය ---------------

II යුගය ---------------

**42)** කච්චකෙට්ට අභ්‍යාස සහ චාලි අභ්‍යාස යොදා ගන්නේ කුමන භාරතීය නර්තන සම්ප්‍රදායන් සඳහා ද?

I කච්චකෙට්ට අභ්‍යාස ---------------

II චාලි අභ්‍යාස ---------------

**43)** ගම්පොල යුගයට හා මහනුවර යුගයට අයත් දේශාඨන වාර්ථා කරුවන් දෙදෙනෙකු නම් කරන්න.


I ගම්පොල යුගය ---------------

II මහනුවර යුගය ---------------

**44)** පහත රූප සටහනෙහි A රූපයෙන් දක්වෙන චරිතය හා B රූපයෙන් දැක්වෙන සැරසිල්ල නම් කරන්න.



A



B

I චරිතය ---------------

II සැරසිල්ල ---------------

45) කාවඩි නර්තනයේ දී කරපිට තබාගන්නා කාවඩිකූට්ටමේ සංකේතවත් කරන කඳු දෙක වන්නේ,

I --------------------


II --------------------

46) ශාන්තිකර්ම සැරසිලි ලෙස හැඳින්වෙන අයිලය සහ කපාල කුඩුව අයත් වන්නේ කුමන ශාන්තිකර්ම සඳහා ද?

I අයිලය ---------------

II කපාල කුඩුව ---------------

- **අංක 47 සහ 48 ප්‍රශ්න සඳහා පහත රූප සටහන ඇසුරු කර ගන්න.**



A



B



C



D

47) ඉහත B හා D රූපවලින් දැක්වෙන ආභරණ නම් කරන්න.

I --------------------

II --------------------

48) A හා C රූපවලින් දැක්වෙන නර්තන සම්ප්‍රදායන් දෙකෙහි යොදා ගන්නා සංගීත සම්ප්‍රදායන් නම් කරන්න.

I --------------------

II --------------------

49) **" සිරස බඳින ජටා සතර පලමු ලේ විලේ - සරොස වෙන් බලා සිටිති සොහොන් දඩු පොලේ "**

ඉහත කවිය අයත් ශාන්තිකර්මය හා චරිතය නම් කරන්න.

I ශාන්ති කර්මය ---------------

II චරිතය ---------------

50) නව නළු රසයට අනුව රති සහ උත්සාහය යන ස්ථායීභාවයන් තුළින් උත්පන්න වන රසයන් වෙන වෙනම ලියන්න.

I රති ---------------

II උත්සාහ ---------------

# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்

## Sabaragamuwa Provincial Education Department

| | | | |
|---|---|---|---|
| තෙවන වාර පරීක්ෂණය | - 2024 | ශ්‍රේණිය | - 13 |
| மூன்றாம் கால சோதனை | - 2024 | தரம் | - 13 |
| Third term test | - 2024 | Grade | - 13 |

| | | | |
|---|---|---|---|
| නර්තනය | II | කාලය | - පැය 3.00 |
| நடனம் | II | நேரம் | - 3.00 மணி |
| Dancing | II | Time | - 3.00 hours |

**අමතර කියවීම් කාලය මිනිත්තු 10**

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්**

- මෙම ප්‍රශ්න පත්‍රය I, II හා III වශයෙන් කොටස් **තුනකින්** සමන්විත වේ.
- I කොටසේ 1 හා 2 ප්‍රශ්න අනිවාර්ය වේ.
- II හා III කොටස්වලින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නය බැගින් හෝ තෝරාගෙන, අනිවාර්ය ප්‍රශ්න **දෙක** ද ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සැපයිය යුතු ය.
- සෑම ප්‍රශ්නයකම (i) කොටසට ලකුණු 06ක් ද (ii) කොටසට ලකුණු 06ක් ද (iii) කොටසට ලකුණු 08 බැගින් මුළු ලකුණු 20ක් බැගින් හිමි වේ.

### I - කොටස

1) i. පහත සඳහන් බෙර පද අතරින් ඔබ උගත් සම්ප්‍රදායට අයත් බෙර පදය තෝරා ගෙන ප්‍රස්ථාර කරන්න.

a) තෙහිං තකු තෙහිං තකු තෙහිං ජිං ගත් තත් ජිං තරිකිට

b) දිත්තම් දිතකු දොම් දොම් තාම්

c) කුදත් තක්කිට තකට ජිමිතක

ii. පහත සඳහන් කවි පදය අදාළ තිත් රූපයට අව ග්‍රහයෙන් මාත්‍රා 2 4 තාල රූපයට ප්‍රස්ථාර කරන්න.

a) "ඉනේ සවඩි රන් කෙදිවන් පයේ ගිගිරි වලලු ලවන් "

iii. ගණපති වන්නම අඩව්ව හෝ ලලිත රාග තාලය සිංදු වන්නමේ ඉරට්ටිය හෝ තිසරා වන්නම අඩව්ව ප්‍රස්ථාර කරන්න.

2) දේශීය නර්තන කලාවේ ඓතිහාසික තොරතුරු විමසීමේ දී යුග පිළිබඳ ව අධ්‍යනය කිරීමෙන් ඒ ඒ යුගයන් හි නර්තන කලාව පැවති තත්ත්වය පිළිබඳ සාධක ලැබේ.

i. පොළොන්නරු යුගයේ නර්තන කලාව පැවති තත්ත්වය පිළිබඳ පුරාවිද්‍යාත්මක සාධක 2ක් ඇසුරින් විමසන්න.

ii. දඹදෙණි යුගයේ තූර්ය භාණ්ඩ භාවිතය පිළිබඳ ව සාධක 2ක් ඇසුරින් කරුණු විමසන්න.

iii. 1940-1960 තුළ නර්තන අධ්‍යාපනයේ ප්‍රවර්ධනය සිදුවූ ආකාරය සාධක 4ක් ඇසුරින් පැහැදිලි කරන්න.

## II - කොටස

3) දේශිය නර්තන සම්ප්‍රදායන්ට අයත් ශාන්තිකර්ම ඒවාට ආවේණික වූ අනන්‍යතාවයන්ගෙන් යුක්ත වේ.

i. වලියක් මංගල්‍යය ශාන්තිකර්මය පැවැත්වීමේ අරමුණු පැහැදිලි කරන්න.

ii. රට යකුම ශාන්තිකර්මයේ නානුමුරය පෙළපාළි අංගයේ දී ආංගික හා වාචික අභිනය භාවිත වන ආකාරය නිදසුන් මගින් පැහැදිලි කරන්න.

iii. සමාජයේ සහජීවනය වර්ධනයෙහි ලා කිරි මඩුව ශාන්තිතර්මයෙන් ලැබෙන පිටිවහල අගයමින් අදහස් ඉදිරිපත් කරන්න.

4) ශාන්තිකර්මවල විචිත්‍ර බව සඳහා විවිධ සැරසිලි භාවිත කරන අතර එහි උපත් කතා මගින් සමාජ සංසිද්ධි විවරණය කෙරේ.

i. සන්නි යකුම ශාන්තිකර්මයේ පුරාවෘත්ත කතා දෙක නම් කර ඉන් එක් කතා පුවතකින් සමාජ සංසිද්ධි විවරණය කරන ආකාරය පැහැදිලි කරන්න.

ii. බලි ශාන්තිකර්මයේ නර්තනයේ හා ගායනයේ දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ විස්තර කරන්න.

iii. සන්නි යකුම ශාන්තිකර්මය අහාර්ය අභිනයෙන් පොහොසත් ශාන්තිකර්මය කි වෙස්මුහුණු හා සැරසිලි ඇසුරින් මෙම කියමන සනාථ කරන්න.

5) "ගැමි නැටුම් ගැමි සමාජයේ ජීවන රටාව විවරණය කරන කැඩපත කි. "

i. සිංහල ගැමි නැටුමෙහි ගායනා මගින් පිළිබිඹු වන ඇදහිලි හා විශ්වාස ගැමි නැටුම් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

ii. සිංහල ද්‍රවිඩ ගැමි නැටුම් හි සමානතා ලක්ෂණ දක්නට ලැබේ ගැමි නැටුම් 4ක් නම් කර එහි සංස්කෘතික වශයෙන් ඇති සමානතා පිළිබඳ විස්තර කරන්න.

iii. ඌරා යක්කමේ හෝ පොත්කඩේ යක්කම මගින් පිළිබිඹු වන සමාජ සාරධර්ම පිළිබඳව කරුණු ඉදිරිපත් කරන්න.

## III - කොටස

6) පහත සඳහන් වගුවෙහි (අ) (ආ) (ඉ) යන කොටස්වලට අදාළ ව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| (අ) කොටස | (ආ) කොටස | (ඉ) කොටස |
|---|---|---|
| ජතිෂ්වරම් | ශාප්මෝචන් | මහා පීටර් |
| පදම් | ලෝමහංස | චෛකොව්ස්කි |
| ආමද් | පටාචාරා | III-හෙන්රි |
| තෝඩායම් | චිත්‍රාන්ගදා | 14-ජෝජ් නෝවේර් |

i. (අ) කොටසින් කතක් නර්තන සම්ප්‍රදායට අදාළ නර්තන අංගයක් තෝරා එහි සුවිශේෂ ලක්ෂණ විස්තර කරන්න.

ii. (ආ) කොටසින් දේශීය මුද්‍රා නාට්‍යක් තෝරා ගෙන එහි රංග රචනය පිළිබඳ ව ඇගයීමක් කරන්න.

iii. (ඉ) කොටසින් හංස විල මුද්‍ර නාට්‍යයේ සංගිත ශිල්පියා හඳුනාගෙන ඔහුගේ සේවාව පිළිබඳ ව ඇගයීමක් කරන්න.

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

7) අද්‍යතන කලා අංග විවිධාංගීකරණයේ දී පෙරදිග හා අපරදිග ආභාසය බෙහෙවින් ලබා ඇති බව ප්‍රදර්ශනය වේ.

i. අද්‍යතන ප්‍රාසාංගික නර්තනය කෙරෙහි පෙරදිග හා අපරදිග ආභාසය ලැබී ඇති ආකාරය පිළිබඳ විමසන්න.

ii. ප්‍රාසාංගික නර්තනය සඳහා භාවිත රංග වස්ත්‍රාභරණ පිළිබඳ ව ඔබේ අදහස් දක්වන්න.

iii. අද්‍යතන ප්‍රාසාංගික නර්තන අංග සන්නිවේදනය කිරීමෙහි ලා රූපවාහිනියෙන් දක්වන දායකත්වය පිළිබඳ ව විමසන්න.

8) නූතන ප්‍රාසාංගික නර්තන නිර්මාණයේ දී අනුෂාංගික කලා භාවිතය විශේෂ වේ.

i. රංග භූමි අලංකරණයේ දී ප්‍රාසාංගික බව තීව්‍ර කිරීමෙහි ලා චිත්‍ර කලාවේ දායකත්වය විග්‍රහ කරන්න.

ii. ශාන්තිකර්මවල රංගභූමි අලංකරණය සහ නූතන වේදිකාවේ ආලෝකකරණය පිළිබඳ ව විග්‍රහ කරන්න.

iii. රූපවාහිනී රියැලිටි නර්තන අංගවල දී අනුෂාංගික අංග භාවිතය පිළිබඳ ව කරුණු ඉදිරිපත් කරන්න.

PAST PAPERS WIKI
(11) WWW.PastPapers.WiKi (11)
Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

PARCEL NO

LOL.lk
BookStore



# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න



කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

## සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න